# දත්ත ආරක්ෂණ අධිකාරිය
# தரவுப் பாதுகாப்பு அதிகாரசபை
# Data Protection Authority

1 මහල - අංක 5 ගොඩනැගිල්ල, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකතන: +94 (0)112697241 ඉ-මේල්: info@dpa.gov.lk වෙබ් අඩවිය: www.dpa.gov.lk


මගේ අංකය: DPA/Legal/01/01 දිනය: **2024** සැප්තැම්බර් 13

**පෞද්ගලික දත්ත ආරක්ෂණ චක්‍රලේඛ: අංක 01/2024**

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරු**
**සියලුම කොමිෂන් සභා සභාපතිවරුන්**
**පළාත් ප්‍රධාන ලේකම්වරු**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**දිස්ත්‍රික් ලේකම්වරුන්**
**රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සභාපතිවරුන්, රාජ්‍ය සමාගම් ප්‍රධානීන් හා රාජ්‍ය බැංකුවල සභාපතිවරුන්**

## 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත රාජ්‍ය අංශයේ භාවිතය සහ දත්ත ආරක්ෂණ අධිකාරිය හඳුන්වා දීම

**1. පසුබිම**

2022 මාර්තු 19 දින සිට බලාත්මක වූ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (මින් මතු "පනත")[1], එහි විධිවිධාන යටතේ, නොයෙක් ගනුදෙනු සහ සන්නිවේදනයන්හි නියැලී සිටින දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අවශ්‍ය නියාමන ක්‍රමවේදයක් ඇති කරන අතරම, එහි පූර්විකාවේ දක්වා ඇති පරිදි ඩිජිටල් ආර්ථිකයක් තුළ නවෝත්පාදනය හා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම සඳහා යාන්ත්‍රණයක් සපයයි.

1.1. මෙම පනත මගින් "පෞද්ගලික දත්ත" (personal data), එනම් "දත්ත දායකයකු" (data subject) ලෙසින් හැඳින්වෙන ස්වභාවික පුද්ගලයෙකු ඍජුව හෝ වක්‍රව හඳුනාගත හැකි ඕනෑම තොරතුරක් සැකසීම නියාමනය කරයි. මෙම පනතට පොදු අධිකාරීන් (රාජ්‍ය ආයතන) සහ පෞද්ගලික අංශයේ ආයතන යන දෙ අංශයෙන්ම සේවා සැපයීමේ දී ඇතිවිය හැකි ඕනෑම අහිතකර බලපෑමකින් "දත්ත දායකයන්ගේ" තොරතුරු වල පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම ඇතුළත් වේ. මෙම පනත යටතේ පුරවැසියන් සහ පුරවැසියන් නොවන පුද්ගලයින්ගේ පෞද්ගලික දත්ත සමාන අන්දමින් ආරක්ෂා කර ඇත (දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් පනතේ II කොටසෙහි දක්වා ඇත).

[1] පනත http://documents.gov.lk/files/act/2022/3/09-2022_S.pdf යන යොමුවෙන් බාගත කළ හැකි ය.

1.2.මෙහි දී "පොදු අධිකාරිය" (Public authority) යන්නෙන් අමාත්‍යාංශයක්, ඕනෑම දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, ව්‍යවස්ථාපිත ආයතනයක් හෝ කිසියම් ලිඛිත නීතියකින් පිහිටුවන ලද ආයතනයක් හෝ අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ නිර්මාණය කරන ලද ආයතනයක් අදහස් වේ. පනත විසින් නියාමනය කරනු ලබන දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් කටයුතු සිදු කරනු ලබන ආයතන "පාලකවරයා" (Controller) සහ දත්ත "සකසන්නා" (Processor) ලෙස හඳුන්වනු ලැබේ.පෞද්ගලික දත්ත සැකසීමේ ක්‍රමවේද සහ අරමුණු පිළිබඳව මූලික වශයෙන් තීරණය කරනු ලබන ආයතන වන "පාලකවරයන්" මත පනතේ කොටස් කිහිපයක් යටතේ නිශ්චිත නීතිමය බැඳීම් කිහිපයක් පනවා ඇත. "සකසන්නන්" යනු පාලකවරයෙකු වෙනුවෙන් යම් පෞද්ගලික දත්ත සැකසුම් කාර්යයන් ඉටු කිරීමට පාලකවරයෙකු විසින් කොන්ත්‍රාත්තු ලබා දී ඇති පාර්ශවයයි.

1.3.එවැනි පෞද්ගලික දත්ත සැකසීමේ ක්‍රියාවලීන් පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ශ්‍රී ලංකාව තුළ භෞමිකව සිදු කෙරෙන අවස්ථාවන්හි දී මෙන්ම ශ්‍රී ලංකාව තුළ සිටින "දත්ත දායකයන්ට" විශේෂිතවම භාණ්ඩ හෝ සේවා සපයනු ලබන හෝ එවැනි තැනැත්තන්ගේ ක්‍රියාකලාපය අධීක්ෂණය කරනු ලබන අවස්ථාවන්හි දී මෙම පනත අදාළ වේ.

1.4.පනෙතහි 3(1) වගන්තියට අනුව, දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව, වෙනත් ඕනෑම ලිඛිත නීතියක පවතින ප්‍රතිපාදනයක් මෙම පනතේ ප්‍රතිපාදන වලට පටහැනි වේ නම් එකී වෙනත් ලිඛිත නීතියේ ප්‍රතිපාදන නොතකා මෙම පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය. කෙසේ වෙතත්, පොදු අධිකාරියක් වෙනත් ඕනෑම ලිඛිත නීතියකින් පාලනය වන විට, පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් එවැනි ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත සැකසීම සිදු කිරීම මෙම පනතට අනුකූලව නීත්‍යානුකූල විය යුතු ය.

## 2. පනත අදියර වශයෙන් බලාත්මක කිරීම

2.1.පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලැබී ඇති බලතල අනුව තාක්ෂණ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද නියෝගයක් මගින් (2023 ජූලි 21 දිනැති අංක 2341/59 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද), විශේෂයෙන්ම දත්ත ආරක්ෂණ අධිකාරයෙහි සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය 2023 අගෝස්තු මස දී පත් කිරීමට හැකි වන පරිදි, 2023 ජූලි 17 දින පනතෙහි V කොටස (දත්ත ආරක්ෂණ අධිකාරිය) බලාත්මක වන දිනය ලෙස නම් කරන ලදි.

2.2.එසේම, 2024 ජනවාරි 8 දිනැති අංක 2366/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් තාක්ෂණ අමාත්‍යවරයා විසින් පහත සඳහන් පරිදි පනත බලාත්මක වන දිනයන් දැනුම් දී ඇත:

(අ) පනතෙහි VI (අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය), VIII (අධිකාරියේ අරමුදල), IX (විවිධ) හා X (අර්ථ නිරූපණය) යන කොටස්හි විධිවිධාන බලාත්මක වන දිනය ලෙස 2023 දෙසැම්බර් 1 වැනි දින,

(ආ) පනතෙහි I (පෞද්ගලික දත්ත සැකසීම), II (දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්), III (පාලකවරුන් සහ දත්ත සකසන්නන්) හා VII (දඩ මුදල්) යන කොටස්හි විධිවිධාන බලාත්මක වන දිනය ලෙස 2025 මාර්තු 18 වැනි දින.

2.3.එබැවින්, 2025 මාර්තු 18 දින සිට පනත ක්‍රියාත්මක හා බලාත්මක වනු ඇත. තම පෞද්ගලිකත්වයට හානි වන පරිදි තමන්ගේ පෞද්ගලික දත්ත රැස්කර, ගබඩා කර සහ දත්ත සකසා ඇති බව විශ්වාස කරන පුරවැසියන්ට 2025 මාර්තු 18 දිනෙන් පසු දත්ත ආරක්ෂණ අධිකාරියට පැමිණිලි කළ හැකි ය.

2.4.එසේම, "ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා පෞද්ගලික දත්ත භාවිතා කිරීම" නැමැති පනතෙහි IV කොටස 2025 මාර්තු 18 වැනි දිනට පසු නිශ්චිත දිනයක සිට බලාත්මක වන බවට ප්‍රකාශ කරනු ඇත.

### 3. දත්ත ආරක්ෂණ අධිකාරිය

3.1.පෞද්ගලික දත්ත සැකසීම මත රඳා පවතින දත්ත මත පදනම් වූ අනාගත ඩිජිටල් සමාජයක් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය ස්වාධීන ජාතික නියාමන යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට මෙම පනත මඟින් හැකියාව ලැබේ. මෙම පනතේ විධිවිධානවලට අනුව, දත්ත ආරක්ෂණ අධිකාරිය විධිමත් ලෙස පිහිටුවීම සඳහා 2023 අගෝස්තු මාසයේ දී ජනාධිපතිවරයා විසින් අධිකාරියේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන ලදී. පනතේ 31 වන වගන්තියට අනුව, අධිකාරියේ පරමාර්ථ පහත පරිදි වේ:

(අ) මෙම පනතේ විවිධානවලට අනුකූලව පෞද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීම;
(ආ) රාජ්‍ය හා පුද්ගලික අංශයේ ක්‍රියාවලීන් සහ සේවා ඩිජිටල්කරණය කිරීමෙන් ඇති වන යම් අහිතකර බලපෑමකින් දත්ත දායකයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම;
(ඇ) ඩිජිටල් ගනුදෙනු සහ සන්නිවේදන කටයුතුවල නිරතවන දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා යාන්ත්‍රණ සැපයීම;
(ඈ) ඩිජිටල් ආර්ථිකයේ වර්ධනයට සහ නවෝත්පාදනයට පහසුකම් සැලසීම සඳහා මේ පනතේ විධිවිධාන සමඟ ඇති නියාමන අනුකූලතාව සහතික කිරීම.

3.2.පනතෙහි 33 වැනි වගන්තිය මගින් මෙම අධිකාරියෙහි කාර්ය සහ කර්තව්‍යයන් සවිස්තරව දක්වා ඇත.

3.3.උපදේශන ප්‍රවේශයක් භාවිතා කරමින් 2024 වසරේ තුන්වැනි හා හතරවැනි කාර්තු තුළ මෙම පනත බලාත්මක කිරීම සඳහා වූ ප්‍රතිපත්ති රාමුව සහ රීති සහ රෙගුලාසි සකස් කිරීමටත්, 2024 වසරේ හතරවැනි කාර්තුව තුළ සහ 2025 වසරේ පළමු කාර්තුව තුළ එම ප්‍රතිපත්ති, රීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇති කිරීමටත් දත්ත ආරක්ෂණ අධිකාරිය අපේක්ෂා කරයි. මෙම පනතේ බලතල ක්‍රියාත්මක කරමින් අධිකාරිය විසින් ඉදිරියේ දී සම්පාදනය කිරීමට නියමිත සම්මත රීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කරන තෙක්, ඒ ඒ ආයතන විසින් සකසනු ලබන පෞද්ගලික දත්තවල පරිමාණයන් සහ ස්වභාවය නොසළකා පහත සඳහන් අවශ්‍යතා කෙරෙහි සියළුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ විශේෂ අවධානය යොමු කෙරේ.

### 4. පොදු අධිකාරීන් සඳහා පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි බලපෑම

4.1.අභ්‍යන්තර හා බාහිර පෞද්ගලික දත්තවල පාලකවරයන් ලෙස බොහෝ රාජ්‍ය ආයතන කටයුතු කරන බැවින්, පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා සුදුසු තාක්ෂණික සහ සංවිධානාත්මක පියවර ක්‍රියාත්මක කළ යුතුය. (උදා.: උල්ලංඝනයන් (personal data breaches) හඳුනා ගැනීම, සහ සංකේතනය (encryption) හෝ වෙනත් තොරතුරු ආරක්ෂණ පියවරයන් සැපයීම).

4.2.එබැවින්, "පාලකවරයෙකු" වශයෙන් ක්‍රියා කරන සියලුම රාජ්‍ය ආයතන පනතේ I කොටස යටතේ සැකසුම් වගකීම්වලට අනුකූලව පෞද්ගලික දත්ත එකතු කර සකස් කිරීමට සහතික විය

යුතු ය. ඔවුන් විසින් මෙහි දී නීත්‍යානුකූලභාවය (5 වගන්තිය), අරමුණක් නිශ්චිතව දැක්වීම (6 වගන්තිය), නිශ්චිතව දක්වන ලද අරමුණට සීමා කිරීමේ අවශ්‍යතාව (7 වගන්තිය), නිරවද්‍යතාවය සහතික කිරීම (8 වගන්තිය), රඳවා ගැනීමේ කාල සීමාව (9 වගන්තිය), විශ්වසනීයත්වය සහ රහස්‍යභාවය පිළිබඳව (10 වගන්තිය) හා පාරදෘශ්‍යභාවය (11 වගන්තිය), සම්බන්ධ වගකීම්වලට අනුකූල විය යුතුය.

(අ) සියලුම රාජ්‍ය ආයතන විසින් පනතෙහි 12 වැනි වගන්තිය යටතේ එලදායි "දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහනක්" (Data Protection Management Program) හරහා ඉහත වගකීම්වලට අනුකූල වීම සඳහා වන වගවීම සහතික කළ යුතු වේ. පනතේ II කොටස යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමත් මෙයට ඇතුළත් වේ.

(ආ) සුදුසු "දත්ත ආරක්ෂණ නිලධාරියෙකු" (Data Protection Officer) පත් කිරීම වැනි පනතේ III වන කොටස යටතේ දක්වා ඇති අමතර වගකීම් එක් එක් ආයතනය විසින් පිළිපැදිය යුතු අතර (20 වගන්තිය), අවශ්‍ය අවස්ථාවන්හි දී පනතේ 24 වගන්තිය යටතේ ඇතැම් පෞද්ගලික දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සඳහා "දත්ත ආරක්ෂණ බලපෑම් ඇගයීම්" (Data Protection Impact Assessments) සිදු කළ යුතුය.

(ඇ) පාලකවරයෙකු වෙනුවෙන් පෞද්ගලික දත්ත සකසන ගිවිසුම්ගත තෙවන පාර්ශ්වයක් පනත යටතේ "සකසන්නෙකු" ලෙස දක්වනු ලබන වන අතර, ඔවුන් ද මෙම පනතට අනුකූල වීම සහතික කිරීමට පාලකවරයාට සහාය විය යුතුය.

4.3. 26 වැනි වගන්තියේ විස්තර කර ඇති පරිදි දේශසීමා හරහා පෞද්ගලික දත්ත සංචරණය (cross-border data flow) සම්බන්ධ පනතෙහි විධිවිධාන කෙරෙහි ද ඔබේ විශේෂ අවධානය යොමු කෙරේ. එය මේඝ ධාරිතා සපයන්නන්ගේ (Cloud Services Providers) සහාය ඇතිව තුන්වන රටක පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණින් ශ්‍රී ලංකා භූමියෙන් බැහැරට පෞද්ගලික දත්ත ගෙනයාම සම්බන්ධයෙන් වූ තත්ත්වයන්ට අදාළ වේ. මෙම සේවා සැපයුම්කරුවන් ද අදාළ දත්ත ආරක්ෂණ නීති සහ රෙගුලාසි මෙන්ම පෞද්ගලික දත්ත ඇතුළුව දත්ත කළමනාකරණය සඳහා මේඝ ධාරිතා සේවා භාවිතය හා සම්බන්ධ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන බවට වග බලා ගත යුතු . වේ.

4.4.මෙම පනතේ විධිවිධානසමඟ නිසි ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා, හැකිතාක් දුරට සියලුම ආයතන සහ ක්ෂේත්‍රවල ක්‍රියාකාරී මැදිහත්වීමේ වැදගත්කම දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් අවබෝධ කරගෙන ඇත. ඒ අනුව, පනත විසින් අවසර දී ඇති තාක් දුරට, මූල්‍ය සහ බැංකු, රක්ෂණ, සෞඛ්‍ය, විදුලි සංදේශ, සිවිල් ලියාපදිංචිය සහ සංචාරක වැනි පෞද්ගලික දත්ත රැස් කිරීම සහ සැකසීමට අදාළ ප්‍රධාන අංශ/ක්ෂේත්‍රවල නියෝජිතයන් සමඟ අනෙකුත් ප්‍රායෝගික තත්වයන් පිළිබඳව නිරන්තර සංවාදයක් පවත්වා ගැනීමට දත්ත ආරක්ෂණ අධිකාරිය අපේක්ෂා කරන අතර, පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන රීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම වැඩි දියුණු කිරීම සඳහා අදාළ උපදේශක කමිටු පිහිටුවනු ලැබේ.

4.5.තවද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) සහ පෞද්ගලික අංශයේ ස්වේච්ඡා සම්පත්දායකයන් විසින් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ සහ උසස් සහතිකපත්‍ර වැඩසටහන් කඩිනමින් ආරම්භ කරනු ඇත. පනතෙහි දක්වා ඇති ඉහත සඳහන් නීතිමය ප්‍රතිපාදන සහ පසුකාලීනව මෙම අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන නියාමන රාමුවලට අදාළ කළමනාකාරීත්ව තත්ත්වයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්, නීති නිලධාරීන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ මානව සම්පත් කළමනාකරණය භාර නිලධාරීන් ඇතුළත් වන පරිදි සෑම රාජ්‍ය ආයතනයකම ප්‍රධාන නිලධාරීන්ට තවදුරටත් පැහැදිලි කිරීම සඳහා 2024 ඔක්තෝබර් මස මැද භාගයේ සිට දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සූදානම් කර ඇත.

4.6.ඒ අනුව පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු ආරම්භ කිරීම සඳහා අදාළ විධාන/උපදෙස් නිකුත් කරන ලෙස ඔබ යටතේ ඇති සියලුම ආයතන වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව දන්වමි. ඔබගේ පහසුව සඳහා එවැනි අනුකූලතාවන්ට අදාළ ක්‍රියාකාරකම්ව සම්බන්ධ පිළිබඳ සරල නිදර්ශනයක් මෙම චක්‍රලේඛයේ **ඇමුණුම-1** හි දක්වා ඇත.

4.7.සියලුම ප්‍රධාන තොරතුරු සහ අදාළ නීතිමය ලේඛන යනාදිය දත්ත ආරක්ෂණ අධිකාරියේ නිල වෙබ් අඩවියේ (ලිපිනය: www.dpa.gov.lk) ප්‍රකාශයට පත් කෙරේ. අධිකාරියේ නිල ඉ-මේල් ලිපිනය වන info@dpa.gov.lk හරහා ද අධිකාරිය සම්බන්ධ කර ගත හැක.

**අර්ජුන හේරත්**
**සභාපති**
**දත්ත ආරක්ෂණ අධිකාරිය**

**<u>පිටපත්:</u>**

| | | | |
|---|---|---|---|
| **1.** | **ජනාධිපති ලේකම්** | - | **කරු. දැ.ගැ.පි. හා අ.ක.ස.** |
| **2.** | **අග්‍රාමාත්‍ය ලේකම්** | - | ,, |
| **3.** | **අමාත්‍ය මණ්ඩලයේ ලේකම්** | - | ,, |
| **4.** | **පාර්ලිමේන්තු මහලේකම්** | - | ,, |

## ඇමුණුම 1 – පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූල වීම සඳහා වූ මූලික පියවර

**පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූල වීම සඳහා වූ මූලික පියවර**

**(1) දැනුවත් කිරීම:**
පනතෙහි විධිවිධාන සහ ඊට අනුරූපව සපුරාලිය යුතු අනුකූලතා පිළිබඳව කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේ දැනුවත් බව සහතික කිරීමට පියවර ගැනීම .

**(2) පාලන ව්‍යුහය:**
පනතට අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා දත්ත ආරක්ෂණ නිලධාරි (DPO), රහස්‍යතා පිළිබඳ ශූරයන් (privacy champions) සහ/හෝ අභ්‍යන්තර මෙහෙයුම් කමිටුවක් පත් කිරීමෙන් නිසි අභ්‍යන්තර පාලන ව්‍යුහයක් සකස් කිරීමට පියවර ගැනීම.

**(3) පෞද්ගලික දත්ත විගණනය:**
ඔබ ආයතනය සතු පෞද්ගලික දත්ත මොනවාද, ඒවායේ සම්භවය කුමක්ද සහ ඔබ එය අනාවරණය කරන්නේ කවුරුන් සමඟද යන්නත් සහ ඔබ ආයතනය එවැනි දත්ත තබාගන්නේ ඇයිද යන්නත්, ඊට සම්බන්ධ ක්‍රියාවලීනුත් ලේඛනගත කිරීමට පියවර ගැනීම..

**(4) පරතර/ඌණතා තක්සේරුව:**
ඔබ ආයතනයේ වර්තමාන දත්ත සැකසුම් ක්‍රියාකාරකම් සහ පනතේ විධිවිධාන අතර ඇති පරතරයන් සොයා බලන්න. එවැනි ඌණතාවලට විසඳුම් ලබා දීම සඳහා ප්‍රතිකර්ම සැලැස්මක් සකස් කිරීමට පියවර ගැනීම.

**(5)ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම:**
පනතෙහි දක්වා ඇති විධිවිධාන සපුරාලීම සඳහා ආයතනය සඳහා යෝග්‍ය දත්ත ආරක්ෂණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (උදා: දත්ත දායකයන් සඳහා ප්‍රතිචාර දැක්වීම අයිතිවාසිකම්, දත්ත රඳවා තබා ගැනීම, රහස්‍යතා පිළිබඳ දැනුම්දීම්, කැමැත්ත කළමනාකරණ පුහුණුව ආදිය.).

**(6) පුහුණුව සහ ධාරිතා සංවර්ධනය:**
ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් පනතේ පැන නගින නෛතික අවශ්‍යතා අවබෝධ කර ගෙන ඒවාට අනුකූල වන බවට සහතික වීම සහ අවශ්‍ය තාක්ෂණික කුසලතා වර්ධනය අඛණ්ඩව සිදු කිරීමට වගබලා ගැනීම